Department of Education,Sabaragamuwa Province/ Weekly School

සබරගමුව පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව -සති පාසල

විෂය - මව්බස

2021 ජූනි 21සිට 27 දක්වා සතිය

සතිය - 08

ශ්‍රේණිය :- 5

සැකසුම :- ආර්.කේ.තරංගා මධවන්ති මිය ර/ඇඹි /කාවන්තිස්සපුර ම.වි. 5 ශ්‍රේණිය බාර

පහත සඳහන් වර්ගවලට අයත් නම් ලියූ කඩදාසි තීරු සකස් කර ගන්න.

- එළවළුවල නම්
- පලතුරුවල නම්
- පලා වර්ගවල නම්
- ඒවා රෝල් කර බඳුනකට දමන්න.
- බ්‍රිස්ටල් බෝඩ් එකක පහත සඳහන් වගුව විශාල ලෙස සකස් කර ගන්න.

| එළවළු වර්ග | පළතුරු වර්ග | පලා වර්ග |
|---|---|---|
| | | |
| | | |
| | | |
| | | |
| | | |
| | | |

- නිවසේ ප්‍රදර්ශනය කරන්න.

නිවසේ දී,
2020.08.08

සැප වේවා !
මා ආදරණීය ආච්චි අම්මා වෙත,

ආච්චි අම්මා සනීපයෙන් ඉන්නවා නේද ? ලොකු අම්මාත් සුවෙන් ඇතැයි සිතනවා. චාමර අයියාත් චලනි අක්කාත් පාසල්යනවා ද ? අපි සැම දෙනාත් සුවෙන් සිටිනවා. තාත්තාට නිවාඩුවක් ලද විගස ම ආච්චි අම්මා බලන්නට එන බව අම්මා කිවුවා. මම ඒ ගැන තාත්තාගෙන් ඇසුවා. ලබන සති අන්තයේ ගමේ යන බව තාත්තා කිවුවා.මේ ලිපිය ලියන්නේ ආච්චි අම්මාට ඒ බව දැනුම් දීමට යි. අපි ලබන සති අන්තයේ ගමේ එන බව ලොකු අම්මාටත් කියන්න. ආච්චි අම්මා ඇතුළු පවුලේ සැමට දීර්ඝායුෂ ප්‍රාර්ථනා කරනවා.

ආදරණීය
පොඩි පුතා,
හසිත

1* මෙහි ඇති ආශිර්වාදය කුමක්ද?..............................

2* ලිපිය ආමන්ත්‍රණය කරන්නේ කාටද?..........................................

3* මෙම ලිපිය ලියන්න ස්ථානය කුමක්ද ?................................

4* ලිපිය ලියන්නේ කවුද?............................................................

5* ඔබත් පෞද්ගලික ලිපියක් ඉහත ලිපිය ආදර්ශ කොට ලියන්න?